# අන්තර්ජාල බැංකු ක්‍රම භාවිතය

කේ.ඩී.එච්.යූ. ගුණසේකර[1] එම්.ඒ.ඩී.එන්. සඳමාලි[2]
කේ.ඩී.ඒ.කේ. ප්‍රනාන්දු[3] පී.ඒ.ටී. පද්මසිකා[4]

**සංක්ෂේපය**

අන්තර්ජාල බැංකු ක්‍රම යනු "අන්තර්ජාලය හරහා බැංකු ගනුදෙනු මෙහෙයවනු ලබන ක්‍රමයකි." මෙම අන්තර්ජාල බැංකු ක්‍රම, ජාල බැංකු ක්‍රම ලෙස ද හඳුන්වනු ලබයි. තවද අන්තර්ජාල බැංකු ක්‍රම භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී මීට පෙර මේ සම්බන්ධව සිදුකරන ලද පර්යේෂණයක් ලෙස ඕස්ට්‍රේලියාවේ "Roy Morgan" නම් පර්යේෂණ ආයතනය විසින් 2013 වසරේ දී සිදුකරන ලදි. එම සමීක්ෂණයකට අනුව සොයාගනු ලැබ ඇත්තේ ඕස්ට්‍රේලියාවේ සති 4 ක කාලයක් තුළ දී වයස අවුරුදු 14 ට වැඩි පුද්ගලයින් අතුරින් 56% ක් අන්තර්ජාල බැංකු පහසුකම් අත්විඳ ඇති අතර එම කාල පරිච්ඡේදය තුළ බැංකු වෙත ගොස් තම ගනුදෙනු සිදුකර ඇත්තේ 34% ක පිරිසක් පමණක් වන බවයි. මේ අනුව බැලූ කල ලෝකය පුරා සීඝ්‍රයෙන් ප්‍රචලිත ව පවතින අතර ශ්‍රී ලංකාවේ එම තත්ත්වය කෙබඳු ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව විය. ඒ යටතේ අන්තර්ජාල බැංකු පහසුකම් භාවිතය ස්ත්‍රී පුරුෂභාවය අනුව, පෞද්ගලික සහ රාජ්‍ය අංශය ලෙස රැකියාවේ ස්වභාවය අනුව, වැටුප් මට්ටම අනුව සහ අධ්‍යාපන මට්ටම අනුව කෙසේ වෙනස් වී ඇත් ද යන්න සහ බැංකු මට්ටමින් ඒ සම්බන්ධව පවත්නා ආකල්ප කෙබඳු ද යන්න සොයා බැලීමත් මෙම අධ්‍යයනයේ අරමුණු විය. මෙහි දී දත්ත රැස් කිරීමේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ රාජ්‍ය බැංකු ආයතන තුනක් සහ පෞද්ගලික බැංකු ආයතන පහක් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මඟින් ද කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික් දෙක පාදක කර ගනිමින් සසම්භාවී ලෙස තෝරාගත් අන්තර්ජාල බැංකු ක්‍රම භාවිත කරන පුද්ගලයින් 25 දෙනෙකුගෙන් යුත් නියැදියක් ලබාගෙන ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතයෙන් දත්ත රැස්කර ගැනුණි. එසේ සපයා ගන්නා ලද තොරතුරු SPSS මෘදුකාංගය භාවිතයෙන් විස්තරාත්මක සංඛ්‍යාන මිනුම් ඔස්සේ විශ්ලේෂණය කරන ලදී. එසේ සිදුකරනු ලැබූ විශ්ලේෂණයේ සොයාගැනීම් වූයේ ලබා ගන්නා ලද නියැදියට අනුව අන්තර්ජාල බැංකු ක්‍රම භාවිත කරන්නන්ගෙන් 68%ක් පමණ පුරුෂයින් වන බව ද, 64%ක් පමණ වයස අවුරුදු 31 ත් 50ත් අතර වන පුද්ගලයින් වන

[1] ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, helanigunasekara@hotmail.com
[2] ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, akithmini41@gmail.com
[3] ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, sandamalimuthugoda1@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ), ආර්ථිකවිද්‍යාව, කැලණිය විශ්වවිද්‍යාලය, thilinipatp@gmail.com

බව ද, අධ්‍යාපන මට්ටම අනුව ගත් කල අන්තර්ජාල බැංකු ක්‍රම භාවිත කරන්නන්ගෙන් වැඩි පිරිස උසස් අධ්‍යාපනයක් සහිත පුද්ගලයින් බව ද, එය ප්‍රතිශතාත්මක ව 48%ක් පමණ වන බව ද, වැඩි වශයෙන්ම අන්තර්ජාල බැංකු ක්‍රම භාවිත කරනු ලබන්නේ පෞද්ගලික අංශයේ රැකියාවන්හි නියුතු වූවන් බව ද, එය ප්‍රතිශතාත්මකව 60%ක් පමණ වූ බව ද, මෙම පර්යේෂණය මඟින් අනාවරණය කර ගැනීමට හැකි වුණි. එමෙන්ම රාජ්‍ය බැංකුවලට සාපේක්ෂව පෞද්ගලික බැංකු අශ්‍රිතව අන්තර්ජාල බැංකු ක්‍රම ක්‍රියාත්මක කිරීමට තිබෙන අවශ්‍යතාවය වැඩි බව පෙනී ගිය අතර, එම සම්මුඛ සාකච්ඡා තුළින් පෞද්ගලික බැංකු අශ්‍රිත ව අන්තර්ජාල බැංකු ක්‍රමයට ඇති පාරිභෝගික නැඹුරුව 30%-45%ත් අතර අගයක පැවතුණි. නමුත් රාජ්‍ය බැංකු වල එම අගය 15%-20% අතර පැවතුණි. එම අන්තර්ජාල බැංකු ක්‍රම ව්‍යාප්ත කිරීමට පෞද්ගලික බැංකු විවිධ සානුබල සපයනු ලැබූ අතර රාජ්‍ය බැංකු සම්බන්ධයෙන්ද එලෙස විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක විය. එම නිලධාරීන්ට අනුව නාගරික ප්‍රදේශවල පාරිභෝගිකයින් ග්‍රාමීය පාරිභෝගිකයින්ට වඩා අන්තර්ජාල බැංකු කටයුතු කෙරෙහි නැඹුරු වීමක් ඇත. ඒ අනුව සමස්තයක් වශයෙන් මෙම පර්යේෂණය තුළින් එළඹිය හැකි නිගමනය වූයේ ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාල බැංකු ක්‍රම භාවිතය උසස් අධ්‍යාපන මට්ටමක් සහිත ඉහළ ආදායම් මට්ටමක් සහිත පුද්ගලයින් අතර පමණක් වැඩි වශයෙන් ව්‍යාප්ත ව ඇති බවත් අන්තර්ජාල බැංකු ක්‍රම පිළිබඳව පුද්ගලයින් තුළ පවත්නා වූ දැනුවත්භාවය ප්‍රමාණවත් නොවන බවත් අන්තර්ජාල බැංකු ක්‍රම භාවිතය අඩු ආදායම් සහිත අඩු අධ්‍යාපන මට්ටමක් සහිත පුද්ගලයින් අතරත් ප්‍රචලිත කිරීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවත් හඳුනාගනු ලැබීය.

**මුඛ්‍ය පද :** *අන්තර්ජාල බැංකු ක්‍රම, රාජ්‍ය බැංකු, පෞද්ගලික බැංකු*